# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 9,531—1946ක්වූ මාර්තු මස 15 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**No. 13,941, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1946ක්වූ මැයි මස 2වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට පාර්ගම් හැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බදුදීමකරදෙන්ට හොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල පලාතේ උඩුකිඳ කොරළයේ යටිපලාතකෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 5ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 498. ගම—මැදගොඩගම.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නෝ. | අන්දම. | ප්‍රමාණ, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 45 | තොටුපලගාවහේන, ආරම්බෙහේන | (1) බොරගස්කැටියේ පදිංචි අගම්පොඩිදේවයාලාගේ සොඳිනා, (2) එම සුද්දා, (3) එම බබා, (4) මැදගොඩගම පදිංචි එම සොබනී | හේන | .. 0 2 22 |
| 99 | තොටුපොලගාවහේන .. | (1) අගම්පොඩිදූරයාලාගේ හෙල්නා, (2) එම පුංචිකිරා, (3) එම සිරිපිනි, (4) එම ඔහිමි, (5) එම රන්කොන්දී | එම | .. 0 0 35 |
| 100 | එම .. | (1) එම සොඳිනා, (2) එම සුද්දා, (3) එම බබා, (4) එම සොබනී .. | එම | .. 0 1 0 |
| 101 | එම .. | (1) අගම්පොඩිදූරයාලාගේ හෙල්නා, (2) එම පුංචිකිරා, (3) එම සිරිපිනි, (4) එම ඔහිමි, (5) එම රන්කොන්දී | එම | .. 0 1 1 |
| 108 | කොහෙල්වත්තේ අගලේ හේන | (1) එම හෙල්නා, (2) එම පුංචිකිරා, (3) එම සිරිපිනි, (4) එම ඔහිමි, (5) එම රන්කොන්දී | එම | .. 0 2 0 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1946ක්වූ මාර්තු මස 5වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ජී. ඇල්. ඩී. ඩේවිඩ්සන්,
අතිරේක ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්දුන්කෝරළේ කිරන්තිඩියේ සිංහල මිශ්‍ර පාඨශාලාවට මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" පස්වෙනි කාණ්ඩයේ (203වෙනි පරිච්ඡේදයේ) කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාව උතුමාණන් වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ. ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. P. P. A 1,962. ගම—කිරන්තිඩිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | ප්‍රමාණ, අ. රූ. ප. |
|---|---|---|---|
| 1 | කැටකැරැල්ලගහවත්ත | කිරන්තිඩියේ පදිංචි කාලිංග ජේම්ස් විසින් අයිතිකම්කියනුලබන අවුරුදු 20ක් වයස ඇති රබර්ගස් 72ක්ද, අවුරුදු 30ක් වයස ඇති පොල්ගසක්ද, අවුරුදු 10ක් වයස ඇති කොස්ගසක් සහ අවුරුදු 4ක් වයස ඇති පුවක්ගස් 15ක් ඇති වත්ත | 0 0 38·2 |
| 2 | එම .. | කිරන්තිඩියේ පදිංචි දූවගේ කොර්නේලිස් විසින් අයිතිකම්කියනුලබන අවුරුදු 20ක් වයස ඇති රබර්ගස් 19ක් සහ පොල්ගසක් ඇති වත්ත | 0 0 6·7 |
| 3 | එම .. | කිරන්තිඩියේ පදිංචි කාලිංග ජේම්ස් සහ ඩී. කොරනේලිස් විසින් අයිතිකම්කියනු ලබන (වගාවක් නැති) වත්තේ කොටසක් | 0 0 0·3 |
| 4 | එම .. | පයියාගල ඇලදූවේ පදිංචි ඩබ්ලිව්. ඩිරුනන්ද ගම්වීරයන් විසින් අයිතිකම්කියනු ලබන අවුරුදු 20ක් වයස ඇති පොල්ගස් 3ක් සහ රබර්ගස් 24ක්ද, අවුරුදු 15ක් වයස ඇති දෙහිගසක් සහ අඹගසක්ද සහ අවුරුදු 3ක් වයස ඇති දෙළුම්ගස් 2ක් සහ කෝපිපැල් 8ක් ඇති වත්ත | 0 1 0·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1946ක්වූ අප්‍රේල් මස 29වෙනි දින පෙරවරු 9ගේ සහිසමට මතුගම කානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1946ක්වූ මාර්තු මස 12වෙනි දින කළුතර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගුණරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්ශ.

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම.

### දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

මෙහි පහත විස්තර දැක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස හල්දුම්මුල්ලේ ගම්සභාවේදී වන 1946ක්වූ මැයි මස 2වෙනි දින පූ. භා. 11ට 1935යේ අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් ඌවේ බදුල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනිසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇත හොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

ඇන්. ඒ. අර්න්විස්,
ඉඩම් කොමසාරිස්තුමා.

මේ 1946ක්වූ මාර්තු මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

### දීමට යන ඉඩම්වල විස්තර.

පලාතේ අංකය—අන්තිම ගම් සිතියමේ නො. 290.
ගම—ගම්වසංගම.

| කැබැල්ලේ අංකය. | | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | | ප්‍රමාණය, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 25A | .. | ගම්වසංගම මැදගෙදර රණවීරමුදියන්සෙලාගේ රත්රන්හාමි | .. | 1 | 0 | 4 |
| 25E | .. | කලුපහන මහගමරාලලාගේ අප්පුහාමි .. | .. | 0 | 3 | 38 |
| 25C | .. | ගම්වසංගම එම පුංචිරාල | .. | 1 | 1 | 8 |
| අන්තිම ගම් සිතියමේ නො. 293. ගම—අරලුකලාව. | | | | | | |
| 24B | .. | අරලුකලාවේ ලුවිස්ගෙන්නදීගේ එමලියා ප්‍රනාන්දු | .. | 0 | 1 | 14 |
| 75 | .. | අරලුකලාවේ කෝනාරමුදියන්සෙලාගේ උක්කුබන්ඩා | .. | 0 | 3 | 39 |
| අන්තිම ගම් සිතියමේ නො. 296. ගම—හාල්අඹුතැන්න. | | | | | | |
| 28Q | .. | වැලිමඩ දෙන් ජේම්ස් රත්නායක | | 1 | 0 | 10 |
| 10 | .. | හාල්අඹුතැන්නේ ඇත්තාලිගම ගොඩගේ විලියම් සිංඤෝ | .. | 0 | 1 | 0 |
| 10C | .. | එම .. | .. | 0 | 0 | 26 |
| අන්තිම ගම් සිතියමේ නො. 297. ගම—හරන්කහව. | | | | | | |
| 38 | .. | දුවක්යායෙමිල මුහන්දිරම්ලාගේ මොහොට්ටිහාමි | .. | 1 | 0 | 0 |
| F. T. S. P. 26. ගම—හල්දුම්මුල්ල වවුම. | | | | | | |
| 79B | .. | හල්දුම්මුල්ලේ ඇස්. කරලිනාහාමි | | 0 | 1 | 2·1 |
| 161 | .. | එම බාලසූරියආරච්චිගේ සයිමන් සිංඤෝ .. | .. | 0 | 0 | 24·1 |
| 161B | .. | එම .. | .. | 0 | 0 | 37·9 |

---

## මැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

සබරගමු පලාතේ රත්නපුර දිසා්ත්‍රික්කුමේ පිහිටි මෙහි පහත සඳහන් රජයන්තක ඉඩම්වල අවුරුද්දක් තුළ මැණික් හෑරීමේ බලය ඉල්ලා එවන්ව යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. "Tender for tne Right to Gem" එනම් "මැණික් හෑරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇත්තේ ලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මේ 1946ක්වූ අප්‍රේල් මස 3වෙනි දින පෙරවරු 10.30ක වනතුරු භාර ගනිමින් කාබාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ව ඕනෑය. එසේ නැත්නම් නිසි බලඇලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවේලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම ආදිය සඳහා ඔවුහු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. ඉල්ලීම භාරගත් දින සිට මාසයක් ඇතුළතදී ඉල්ලුම් කාරයා විසින් ඔහු අවසරපත්‍රයක් ලබාගනොගත්තෙහි නම් ඔහු විසින් ගෙවනලද මුදල රජයන්තකවෙනවා ඇත.

5. බද්ද විලංගු කාලය තුළ ඔදුගෙදන්ව යෙදුන ඉඩමේ ඇති ගස්වලට යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැත්නම් ඉදිරිවැටෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාර නොගැනීමේද ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත කම්කරනලදී.

7. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම වැලක්වීමටත් සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්වයෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බදින්ට ඕනෑය.

8. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

9. ඉඩම් ඉල්ලුම්කාරයෝ තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම් වල වැඩපටන්ගන්නා දින සහ වැඩනවත්වන දිනද කොළඹ ලෝක පරීක්ෂකතුමා වෙත දැන්විය යුතුයි. තවද එකී ලෝක පරීක්ෂකතුමා පතල් විභාගයට අවට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්ෂාකිරීමට ඉඩදිය යුතුයි.

10. මෙම ඉඩම්වල තිබෙන ප්‍රමාණය පෙන්නුම්කර තිබෙන්නේ සාමාන්‍ය වශයෙනි. යම් අත්දම්කින් ඉඩම්වල හරි සම්පූර්ණ තිබෙන ප්‍රමාණය මෙහි පහත සඳහන් තිබෙන ප්‍රමාණයට වඩා අඩු නම් දෙවනු පෙනීසියහොත්, එම වෙනස සියයට 10ක් (10%) වැඩි නොවුනිනම් තිබෙන ප්‍රමාණයේ අඩුලුහුඩුකම සම්බන්ධව මුදල් ආපසු ගැනීමට හෝ අඩුකරනැණීමට කරණ ඉල්ලීම ආණ්ඩුව විසින් කල්පනාවට ගනු නොලැබේ.

11. වැඩිදුර කාරණා සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

### ඉඩම්වල තොරතුරු.

(1) කුකුළුකෝරළේ පරගල පිහිටි නො. 224 පැලැතේ ලොට් නො. 336 කොටසක්වන අක්කර 3යි රූඩ් 1ක් පමණ විශාලකම ඇති ගනබොඩමුකලානට මායිම් :—බ්ලොක් A.

උතුරට : අඹගසගෙදර,
නැගෙණහිරට : කුකුළුගඟේ වම් ඉවුරද,
දකුණට : බ්ලොක් බී,
බස්නාහිරට : ඉඩමේ ඉතුරු කොටසද.

(2) කුකුළුකෝරළේ පරගල පිහිටි නො. 224 පැලැතේ ලොට් නො. 336 කොටසක්වන අක්කර 4ක් පමණ විශාලකම ඇති ගනබොඩමුකලානට මායිම් :—බ්ලොක් B.

උතුරට : බ්ලොක් A,
නැගෙණහිරට : කුකුළුගඟේ වම් ඉවුරද,
දකුණට : පන්ගල්ඇල්ලගෙදර,
බස්නාහිරට : ඉඩමේ ඉතුරු කොටසද.

(3) නවදුන්කෝරළේ හල්පාවිල පිහිටි දිගින් දම්වැල් 20ක් පමණ විශාලකම ඇති පනාවැන්නඇලට මායිම් :—

උතුරට : ඇලේ වම් ඉවුරද,
නැගෙණහිරට : දෙලේ ඉතුරු කොටස සහ ලොට් නො. 26යේ නැගෙනහිර මායිමද,
දකුණට : ඇලේ දකුණු ඉවුරද,
බස්නාහිරට : දෙලේ ඉතුරු කොටස සහ පාස්දුරුකන්දේ ගම්මායිමද.

(4) අටකලන්කෝරළේ බලවින්න සහ කිඹිලේගම් තුල ගලා බසින දිගින් දම්වැල් 25ක් පමණ විශාලකම ඇති රක්වානගඟට මායිම් :—බ්ලොක් A.

උතුරට : රක්වානගඟේ වම් ඉවුරද,
නැගෙණහිරට : බ්ලොක් B සහ හපුගෙස්තැන්නේ ගම්මායිම,
දකුණට : රක්වානගඟේ දකුණු ඉවුරද,
බස්නාහිරට : රක්වානගඟේ ඉතුරු කොටස සහ ලොට් නො. 213යේ උතුරු මායිමද.

(5) අටකලන්කෝරළේ බලවින්න සහ හපුගෙස්තැන්න යන ගම් තුල ගලාබසින දිගින් දම්වැල් 44ක් පමණ විශාලකමඇති රක්වානගඟට මායිම් :—බ්ලොක් B.

උතුරට : රක්වානගඟේ වම් ඉවුරද,
නැගෙනහිරට : බ්ලොක් C සහ හපුගෙස්තැන්නට යන අයිපාරද,
දකුණට : රක්වානගඟේ දකුණු ඉවුරද,
බස්නාහිරට : බ්ලොක් A සහ හපුගෙස්තැන්නේ ගම් මායිමද.

(6) අටකලන්කෝරළේ බලවින්න සහ හපුගෙස්තැන්න යන ගම් තුල ගලාබසින දිගින් දම්වැල් 27 පමණ විශාලකම ඇති රක්වානගඟට මායිම් :—බ්ලොක් C.

උතුරට : රක්වානගඟේ දකුණු ඉවුරද,
නැගෙනහිරට : රක්වානගඟේ ඉතුරු කොටස සහ ලොට් නො. 275යේ නැගෙනහිර මායිමද,
දකුණට : රක්වානගඟේ දකුණු ඉවුරද,
බස්නාහිරට : බ්ලොක් B.

(7) කුකුළුකෝරළේ රඹුක පිහිටි දිගින් දම්වැල් 34ක් පමණ විශාලකම ඇති රඹුකඔයට මායිම් :—

උතුරට : රඹුකඔයේ දකුණු ඉවුරද,
නැගෙනහිරට : බෙප්ඩින්ස්වත්තේ මායිමද,
දකුණට : රඹුකඔයේ වම් ඉවුරද,
බස්නාහිරට : නීන්දෙල රඹුකඔයට වැටෙන ස්ථානය.

(8) කුකුළුකෝරළේ රඹුක පිහිටි දිගින් දම්වැල් 26ක් පමණ විශාලකම ඇති කීන්දෙලට මායිම් :—

උතුරට : දෙළේ දකුණු ඉවුරද ;
නැගෙණහිරට : බෙප්බින්වත්තේ මායිමද :
දකුණට : දෙළේ වම් ඉවුරද ;
බස්නාහිරට : රඹුකඹය වැටෙන ස්ථානය.

(9) නවදුන්කෝරළේ දෙනවක ගාතකඩ පිහිටි නො. 161 සැලැසුමේ ලොට් නො. 28J, අක්කර 3 පර්චස් 20ක් පමණ විශාලකම ඇති කුරුවත්තෝතැන්න සහ ගල්අමුනේදෙළ සහ දෙනවකගඟ දිගින් දම්වැල් 12ක් සහ 10ක් පමණ විශාලකම ඇති ඉඩමට සහ දෙළවලට මායිම් :—

උතුරට : ලොට් 28 I, 28K, 28L සහ 28M,
නැගෙනහිරට : ගල්අමුනේදෙළේ වම ඉවුරද,
දකුණට : දෙනවක්ගඟේ වම් ඉවුරද,
බස්නාහිරට : දෙනවක්ගඟේ ඉතුරු කොටස සහ ලොට් නො. 24ද.

ඩී. විජෙසුන්දර,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා වෙනුවට.

වර්ෂ 1946ක්වූ මාර්තු මස 6වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

---

ලෑලි 12ක් දිග අඩි 3ක් පළල අඟල් 20ක් සහ කබල් 40ක් සෑදීම සඳහා ටැන්ඩර්පත්‍ර, 1946ක්වූ මාර්තු මස 29වෙනි දින දවල් 12 දක්වා කළුතර ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් භාරගනු ලැබේ.

වැඩි විස්තර කළුතර කච්චේරියෙන් ලබාගත හැක.

ඩබ්ලිව්. ජී. ද පින්තු,
කළුතර ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙනුවට.

වර්ෂ 1946ක්වූ මාර්තු මස 11වෙනි දින
කළුතර කච්චේරියේදීය.

---

## අභ්‍යන්තර වී මිලයට ගැනීමේ ක්‍රමය.

### ඌව පලාතේ වී අස්වන්න රැස්කරගැනීම.

ඌව පලාතේ දිසාපතිතැන්පත් සෙවැක්ස් ගර්ජී මාටියා වන මම වර්ෂ 1942 දරණ ලංකාරක්ෂක (මිශ්‍ර) 37වෙනි ව්‍යවස්ථාව සමඟත්ද, වර්ෂ 1943 දරණ ලංකාරක්ෂක (වී ගොවිතැන්) ව්‍යවස්ථාව සමඟත්ද, වර්ෂ 1944 දරණ ලංකාරක්ෂක (ආහාර සැපයීම විශේෂ නියෝග) ව්‍යවස්ථාවත් සමඟත්ද සම්පූර්ණ සහ නියම බලතල හිමියෙකු වශයෙන් පහත සඳහන් නියෝගයන් පළකරමි.

මේ නියෝගය ප්‍රසිද්ධකිරීමෙන් පසු ගැළපෙන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකිරීමෙන් අවලංගුකරනතුරු සියළුම අවුරුදුවල සියළුම සෘතුවලදී අස්වන්න රැස්කරගැනීමට බලාපොරොත්තුවන විටඑව, සමයිද, වෙල්ලේස් සහ බින්තැන්න යන කොට්ඨාශයන්හි පිහිටි කුඹුරු හිමියන් හෝ ගොවියන් විසින් පහත සඳහන් විස්තර එම කුඹුරු පිහිටි කොටසේ ගම් මුලාදෑනිතැන හෝ වෙල් මුලාදෑනිතැන වෙත ලියවිල්ලකින් දන්වා සිටිය යුතුයි :—

(අ) ඉඩමේ නම, පිහිටීම සහ ප්‍රමාණය ;

(ආ) ගිවිසුමක් මගින් හෝ කොන්ත්‍රාත්තුවක් මගින් හෝ වෙනයම් ක්‍රමයක් මගින් කුඹුරේ අස්වන්නේ කොටසකට උරුමවාසිකම් ඇති අයගේ සහ මිලාසම ;

(ඉ) (අ) පරිච්ඡේදයේ සඳහන් ඉඩට හිමි කොටසේ විස්තර.

(ඊ) ඉඩමේ පිහිටි ගොයම් කපාගන්නා සහ බේරාගන්නා දිනය.

(අ) (ආ) සහ (ඉ) පරිච්ඡේද උදෙසාවූ කරුණු වහුරු 14 දිනක් ඉකුත්වීමට ප්‍රථමයෙන්ද, (ඊ) පරිච්ඡේදයේ සඳහන් විස්තර කපාගැනීමට සහ බේරාගැනීමට අදහස්කරනු ලබන දිනයට සම්පූර්ණ දින 10ට පෙදර දන්වීය යුතුයි.

(1) ගම් මුලාදෑනිතැන, වෙල් මුලාදෑනිතැන හෝ මා විසින් බලය දෙනලද අන්‍ය අයකු විසින් අස්වන්න තක්සේරුකොට සම්පූර්ණ අස්වන්න සහ කොටස් සටහන්කිරීමට ප්‍රථම හෝ මේ නියෝගවල 3වෙනි ඡේදයේ සඳහන් පරිදි අවසරපත්‍රයක් නොගෙන හෝ තමා විසින් හෝ අන්‍ය අයකු විසින් කමතෙන් හෝ කුඹුරෙන්, අටුවට හෝ වී ගබඩාකර තබන අන්‍ය ස්ථානයකට වී ගෙන යාමට සැලැස්වීම හෝ අවසරදීම සම්පූර්ණයෙන් තහනම්ය.

(2) මහ මෝසමේදී අක්කරයකට පොලා පිරිසිදුකරණලද මහා කන්නයෙන් ශුද්ධ වී බුසල් දෙක බැගින්ද, යල මෝසමේදී බුසල බැගින්ද, ගම් මුලාදෑනිතැනට, වෙල් මුලාදෑනිතැනට හෝ මා විසින් බලය පවරනලද අන්‍ය අයකුට අක්කර බද්ද වශයෙන් කමතේදී භාරදිය යුතුයි.

(3) මේ නියෝගවල 3වෙනි ඡේදයේ සඳහන් පරිදි අවසර පත්‍රය පිට ගෙනයනලද වීවලින් කිසිම කොටසක් පහත දක්වා ඇති පරිදි කෑමට සහ අන්‍ය උවමනාවලට ගැනීම හැර වෙනත් අවසර නොමැතිව වියදම්කළ නොහැක:—එනම්,

(අ) වාර්ෂිකානුගත වියදම් උදෙසා අක්කරයට කැපූ බුසල බැගින්ද ;

(ආ) බිත්තර වී උදෙසා අක්කරයට කැපූ බුසල් 4කට වැඩි නොවන ප්‍රමාණයක්ද ;

(ඉ) ආහාර උදෙසා ගොවියන් සහ කුඹුරු අයිතිකාර ගොවියන් හා ඔවුන්ගෙන් නියම ලෙස යැපෙන්නන් උදෙසා කෙනෙකුට සතියකට කැපූ පේරු 6 බැගින්ද, කුඹුරු වැඩනොකරන අයිතිකාරුවන් සහ නියම වශයෙන් ඔවුන්ගෙන් යැපෙන්නන් උදෙසා කෙනෙකුට සතියකට කැපූ පේරු 4 බැගින්ද වෙත්. එහෙත් එකම සෘතුවකදී වී නිපදවන එක් අයකුට දියහැකි වැඩිම ප්‍රමාණය වී බුසල් 50ට වැඩිනොවිය යුතුයි.

(4) හාල් කූපන් පොත් හිමි වී නිපදවන අයකු හෝ ඔහුගේ යැපෙන්නන් විසින් (3) (ඉ) පරිච්ඡේදයේ සඳහන් පරිදි ආහාර උදෙසා වෙන්කරනලද වී සඳහා පහත දක්වා ඇති ලෙස කූපන් බාරදෙනතුරු ඒ වී ආහාර සඳහා නොකත යුතුයි:—

(අ) ගොවියන් සහ අයිතිකාර ගොවියන් සහ ඔවුන්ගෙන් යැපෙන්නන් විසින් ලබන කැපූ වී පේරු හයට කූපන් එක බැගින්ද,

(ආ) කුඹුරු වැඩනොකරන අයිතිකරුවන් සහ ඔවුන්ගෙන් යැපෙන්නන් විසින් ලබන කැපූ වී පේරු හතරට කූපන් එක බැගින්ද වෙත්.

(5) 3 වැනි ඡේදයේ 3වෙනි පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි I, P. S. 33 දරන ෆෝර්මයෙන් දෙන වී පිටත ගෙනයෑමේ බලපත්‍රය 4වෙනි පරිච්ඡේදයේ සඳහන් නියමිත කූපන් ප්‍රමාණය භාරදෙනතුරු නිකුත්කරනු නොලැබේ.

(6) 3වෙනි පරිච්ඡේදයේ සඳහන් පරිදි ආහාර සහ අනිකුත් උවමනාවල් සඳහා වෙන්කර ඉතිරිවෙන ප්‍රමාණය හෝ මා විසින් නියමකරණලබන වී ප්‍රමාණය ගම් මුලාදෑනිතැනට විකුණා ඔහුගේ කන්තෝරුවට හෝ ආසන්න වී මිලයට ගන්නා මධ්‍යස්ථානයට ගෙනගොස් භාරදී එකලට පවත්නා මිල ප්‍රකාර මුදල් ලබාගත යුතුයි.

මේ නියෝගයෙන් ප්‍රසිද්ධකරනුලබන අවධියේ වී බුසලක මිල රු. 6.

3. ඒ පිටත ගෙනයෑමේ සඳහා අවසරපත්‍ර පහත සඳහන් ක්‍රමයට ගතයුතුයි :—

(අ) එකම ගම් මුලාදෑනියාගේ වසම තුල වී ගෙනයෑම කුඹුරු පිහිටි වසමේ ගම් මුලාදෑනියාගෙන් අවසරපත්‍රය ඉල්ලුම්කර සිටීමට I. P. S. 33 දරණ ෆෝර්මයෙන් අවසරපත්‍රයක් දෙනු ලැබේ;

(ආ) එකම ආදායම් පාලක නිලධාරීතුමෙකුගේ කොට්ඨාශයක පිහිටි වසමකින් තවත් වසමකට වී ගෙනයාම: (අ) දක්වූ පරිදී ගම් මුලාදෑනියාගෙන් අවසරපත්‍රයක් ගෙන ආදායම් පාලක නිලධාරීතුමා ලවා අත්සන්කරවාගත යුතුයි.

(ඉ) හදිසි කටයුතු පිළිබඳ උප දිසාපතිතුමාගේ කොට්ඨාශය හැර ඌවේ ආදායම් පාලක නිලධාරීතුමෙකුගේ කොට්ඨාශයක සිට තවත් කොට්ඨාශයකට වී ගෙනයාම: තමා පදිංචි කොට්ඨාශයේ ආදායම් පාලක නිලධාරීතුමා වෙත D. F. S. & C 34 දරණ ෆෝර්මයේ පිටපත් දෙකකින් යුක්තව ඉල්ලුම්පත්‍රය යැවිය යුතුයි. කුඹුරු පිහිටි වසමේ මුලාදෑනියාගෙන් සහතිකයක් ඉල්ලුම්පත්‍රයට අමුණා යැවිය යුතුයි. අවසරපත්‍රය කච්චේරියෙන් නිකුත්කරණු ලැබේ ;

(ඊ) දිස්ත්‍රික්කයක සිට තවත් දිස්ත්‍රික්කයකට හෝ හදිසි කටයුතු පිළිබඳ කොට්ඨාශයක සිට තවත් කොට්ඨාශයකට වී ගෙනයාම D. F. S. & C 34 ෆෝර්මයේ පිටපත් දෙකකින් යුක්තව ඉල්ලුම්පත්‍රය තමා පදිංචි දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා, උප දිසාපතිතුමා හෝ හදිසි කටයුතු පිළිබඳ දිසාපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතුයි.

4. අවසරපත්‍ර නිකුත්කිරීම, ඉක්මන්කිරීම පිණිස ඉල්ලුම්කරු පදිංචි කොට්ඨාශයේ සහ කුඹුරු පිහිටි කොට්ඨාශයේ ගම් මුලාදෑනියාගෙන් කුඹුරුවල විස්තර සහ පවුලේ ගණන D. F. S. & C 34 දරණ ෆෝර්මයේ ඉල්වා සිටින අනිකුත් විස්තර දක්වෙන රිපෝර්තු ඉදිරිපත්කරන ලෙස ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්වනු ලැබේ.

5. ඉහත දක්වූ පරිදි අස්වන්න රැස්කර සති 6 තුල අවසර පත්‍රයක් ඉල්වා නොසිටියොත් වී සියල්ලම අභ්‍යන්තර වී මිලයට ගැනීමේ ක්‍රමය යටතේ ආණ්ඩුවට ගනු ලැබේ.

6. විශේෂයෙම සඳහා නිකුත්කරනලද අවසරපත්‍ර අඩු ගණනේ මාස 12 පසුවනතුරු ප්‍රවේසම්කර තබාගත යුතුයි. අවසරපත්‍ර ඉදිරිපත්කිරීමට නොහැකිවුවොත් අවසරපත්‍ර නොමැතිව ගෙනෙනලද වී ආණ්ඩුවට ගැනීමට සිදුවෙනවා ඇත.

7. මේ නියෝගයන්හි එක් වගන්තියක් හෝ කඩකිරීම නීති මගින් දඬුවම් ලැබියහැකි වරදක් බව තරයේ සිහිතබාගත යුතුයි.

ඇස්. එච්. වෑඩිංගම්,
ඌවේ දිසාපතිතුමා.

මේ 1946ක්වූ මාර්තු මස 7වෙනි දින
බදුල්ලේ කච්චේරියේදීය.

---

මේ 1943ක්වූ සැප්තැම්බර් මස 27වෙනි දින අංක !,176 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරනලද 1943 අරක්ෂක වී ගොවිතැන පිළිබඳ ව්‍යවස්ථාව යටතේ තිබෙන බලයලත් මම එකී ආඥාපනතේ දෙවන වගන්තිය අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට, නවදුන් සහ කුකුළුකෝරලයන්හි 1946 යල් මෝසම වගාකළහැකි කුඹුරුවල වැපිරීම කළයුතු දිනය වශී 1946ක්වූ අප්‍රේල් මස 10වෙනි දින හෝ ඊට ප්‍රථම බැව් මෙයින් නිවේදනය කරමි.

ඉදින් මෙහි සඳහන් කෝරළයන්හි ඇති කුඹුරුවල එකී දිනයන්හිදී ගොවිතැන් වැඩ අරම්භනොකළ කුඹුරු ඉහතකී නීතියේ කොටස ව්‍යවස්ථාව පරිදි ඔට ලැබී තිබෙන බලය අනුව ඔවුන්ගේ කුඹුරු සියල්ලම මගේ යටතට පැවරෙන බව සියලු දෙනාටම වැඩිදුරටත් මෙයින් දැනුම්දෙමි.

ඇම්. ජේ. පී. සැන්ඩිස්,
සබරගමු පලාතේ මහා ඒජන්තතුමා.

මේ 1946ක්වූ මාර්තු මස 11වෙනි දින
රත්නපුර කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.